2012.05.

**චක්‍රලේඛය 2012/1**

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

සහකාර සමෘද්ධි කොමසාරිස්/දිස්ත්‍රික් නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ

දිස්ත්‍රික් සමෘද්ධි සම්බන්ධීකරණ නිලධාරි

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.

කොළඹ/ගම්පහ/කළුතර/ගාල්ල/මාතර/හම්බන්තොට/රත්නපුරය/කෑගල්ල/බදුල්ල/මොණරාගල/මහනුවර/ මාතලේ/නුවරඑළිය/අනුරාධපුරය/පොළොන්නරුව/කුරුණෑගල/පුත්තලම/අම්පාර/ත්‍රිකුණාමලය/මඩකලපුව වව්නියාව/යාපනය.

## <u>සමෘද්ධි නිලධාරීන් සඳහා පරිගණක පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම</u>

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ නිලධාරීන් සඳහා පරිගණක පුහුණු වැඩසටහන් පහත සඳහන් කර ඇති ආකාරයට ලබාදීමට තීරණය කොට ඇත. මූලික වශයෙන් වැඩසටහන් 02ක් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රාදේශීය පරිගණක පුහුණු මධ්‍යස්ථාන යොදා ගනිමින් ක්‍රියාත්මක කෙරෙනු ඇත. එම වැඩ සටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් උපදෙස් අනුව කටයුතු කළ යුතු බව දන්වමි.

**<u>01. මූලික පරිගණක පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය සඳහා</u>**

මෙතෙක් මූලික පරිගණක පුහුණුව නොලත් සමෘද්ධි බැංකු සංගම් නිලධාරීන් හට මෙම පුහුණුව ලබාදිය යුතුය. මෙම පුහුණු වැඩසටහන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රාදේශීය ආයතන මගින් සති අන්ත දිනවල දින 07ක් (පැය 50ක්) ක්‍රියාත්මක කරන අතර එක් අයෙකුගේ පාඨමාලා ගාස්තුව රු.4500/- කි. පුහුණු පාඨමාලා ගාස්තු අදාල නිලධාරියා අයත් බැංකු සංගමයේ උපයා ගන්නා අරමුදලින් ගෙවිය යුතුය. පාඨමාලා ගාස්තු " සහකාර අධ්‍යක්ෂ,ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය" නමින් ලියන ලද චෙක්පතක් මගින් ගෙවීම් කල යුතු වේ.

තවදුරටත් මූලික පරිගණක පුහුණුව නොලද බැංකු සංගම් නිලධාරීන්හට ආසන්නව පවතින ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු මධ්‍යස්ථාන වල පවතින ඉඩපහසුකම් සැලකිල්ලට ගනිමින්

කණ්ඩායම් සකස් කර පුහුණුවට සහභාගී කළ යුතු අතර එම නිලධාරීන් නොකඩවා පුහුණු වැඩසටහනට සහභාගී කරවීමට කටයුතු කළ යුතුය.

සහභාගී වන නිලධාරීන්ගේ පාඨමාලා ගාස්තු අදාල නිලධාරියා රාජකාරි කටයුතු කරන සමෘද්ධි බැංකු සංගමයෙන් චෙක්පතක් මගින් ලබාදිය යුතුය. මේ සඳහා අදාල ලදුපත් එම බැංකු වලට ලබාදීමට කටයුතු කළ යුතු අතර පුහුණු වැඩසටහන් වලට සහභාගීවන නිලධාරීන්ගේ අත්සන් ලේඛන සෑම වැඩසටහනක් අවසානයේදීම ලබා ගැනීමට කටයුතු කර එහි පිටපතක් මානව සම්පත් අංශයට යොමු කළ යුතුය.

මෙම පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රාදේශීය ආයතන වෙත අදාල බැංකු සංගම්/මහා සංගම් නිලධාරීන් යොමු කිරීම කළ යුතු වන අතර ඔබ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන සමෘද්ධි කළමණාකරු වෙත සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කල යුතුය.

මූලස්ථාන සමෘද්ධි කළමණාකරුවන් විසින් ප්‍රාදේශීය මට්ටමින් අදාල තොරතුරු ඒකරාශී කොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුහුණු කළමණාකරු වෙත ලබාදිය යුතුය.

එක් වැඩසටහනක් අවසන්වීමත් සමග නව කණ්ඩායමක් යොමු කිරීමට කටයුතු කරමින් මෙම පුහුණු වැඩසටහන් කාර්යක්ෂමව කළ යුතුය. ඒ අනුව සියළුම සමෘද්ධි බැංකු නිලධාරීන් හට මෙම පුහුණුව ලබාදීමට චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරන මෙන් දන්වමි.

**<u>02. සමෘද්ධි බැංකු සංගම් ජාල ගත කිරීමට අදාලව සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය සඳහා පරිගණක උපාංග පරිශීලනය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම</u>.**

සමෘද්ධි බැංකු සංගම් ජාල ගත කිරිමේ කටයුතු කාර්යක්ෂම හා ඵලදායි ලෙස මෙහෙයවා ගැනීම සඳහා එකී කටයුතු වල නිරත සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය වෙත ජාල ගත කිරීමට අදාල පරිගණක උපාංග පරිශීලනය පිළිබඳ දැනුම ලබාදීමේ පුහුණු වැඩ සටහනක් පැවැත්වීමට සැළසුම් කර ඇත.

ඒ අනුව මෙම පුහුණු වැඩසටහන් සඳහා පහත සඳහන් ලෙස කාර්ය මණ්ඩලය නම් කර ගත යුතුය.

1. සමෘද්ධි බැංකු හා මහා සංගම් කළමණාකරු
2. සමෘද්ධි බැංකු හා මහා සංගම් සහකාර කළමණාකරු
3. සමෘද්ධි බැංකු සංගමයේ හා මහා සංගමයේ පරිගණක තොරතුරු ඇතුළත් කරන සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු

සමෘද්ධි බැංකු සංගම් ජාල ගත කිරීමට අදාල මෘදුකාංගය නිර්මාණයට දායකවන තාක්ෂණ නිලධාරීන් මගින් මෙකී පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකත්වය ලබාදෙනු ඇත. එයට අදාල විෂය නිර්දේශය, සම්බන්ධ කරගත යුතු සම්පත්දායකයින් පිළිබඳ තොරතුරු සහ වැඩසටහන් ඇස්තමේන්තුව මේ සමග ඔබ වෙත යොමු කරන අතර දෙදින වැඩමුලුවක් ලෙස මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

මෙකී පුහුණු වැඩසටහන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හී පරිගණක විද්‍යාගාර වලදී පැවැත්වීමට කටයුතු කළ යුතු අතර දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂ සමග සාකච්ඡා කර පුහුණුවන නිලධාරීන්ට පහසු පුහුණු මධ්‍යස්ථාන වලදී වැඩ සටහන් පැවැත්විය යුතුය. මෙම මධ්‍යස්ථාන වල පුහුණුවට අවශ්‍ය අන්තර්ජාල පහසුකම්, මල්ටිමීඩියා හා පුහුණුවන්නන් සියළු දෙනාට වෙන් වෙන්ව භාවිතා කළ හැකි පරිගණක යන්ත්‍ර තිබිය යුතුය.

එමෙන්ම පුහුණුව වෙනුවෙන් වැය වන මුදල් පුහුණුලාභීන් අනුයුක්තව ඇති සමෘද්ධි බැංකු සංගමය හෝ මහා සංගමය උපයන මුදලින් දරා ගැනීමට කටයුතු කළ යුතුය. පුහුණුවට අදාලව සකස් කරන ලද ආදර්ශ ඇස්තමේන්තුවක්ද මේ සමග ඔබ වෙත යොමු කරන අතර එක් වැඩසටහනකට සහභාගීවන පුහුණුවන්නන් සංඛ්‍යාවෙන් ඇස්තමේන්තුවේ සඳහන් මුළු මුදල බෙදීමෙන් එක් පුහුණුලාභියෙකුගෙන් අයකළ යුතු මුදල තීරණය කළ යුතු අතර දිස්ත්‍රික් සමෘද්ධි අංශය මගින් මෙම වැඩසටහන් සංවිධානය කොට ක්‍රියාත්මක කළ යුතුය.

මෙම පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී වෘත්තීය පුහුණු අධිකාරියේ ප්‍රාදේශීය ආයතන වෙත අදාල බැංකු සංගම්/මහා සංගම් නිලධාරීන් යොමු කිරීම කළ යුතු වන අතර ඔබ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන සමෘද්ධි කළමණාකරු වෙත සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කල යුතුය.

මුලස්ථාන සමෘද්ධි කළමණාකරුවන් විසින් ප්‍රාදේශීය මට්ටමින් අදාල තොරතුරු ඒකරාශී කොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුහුණු කළමණාකරු වෙත ලබාදිය යුතුය.

තවද දිස්ත්‍රික්කයේ සියළුම සමෘද්ධි බැංකු හා මහා සංගම්වල කළමණාකරු,සහකාර කළමණාකරු හා පරිගණක දත්ත ඇතුලත් කරන සමෘද්ධි සංවර්ධන නිලධාරියෙකු යන සමස්ථ කණ්ඩායම මෙම පුහුණු වැඩසටහනට සම්බන්ධ කරවීමට කටයුතු කළ යුතු අතර පුහුණු වැඩසටහන් අවසානයේ පුහුණුව ලබාගත් නිලධාරීන්ගේ නාමලේඛනයන් ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් අංශය වෙත යොමු කළ යුතු බවද තවදුරටත් දන්වමි.

ආර්.පී.බී.තිලකසිරි

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

1. සභාපති - ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය - අ.ක.ස

2. සාමාන්‍යාධිකාරි - ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය - අ.ක.ස

3. ප්‍රාදේශීය ලේකම් ......................... - අ.ක.ස

4. අධ්‍යක්ෂ ( මුදල්) - ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය - දැ.ගැ. ස

5. අධ්‍යක්ෂ ( බැංකු මූල්‍ය/මහා සංගම්) - ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය - අ.ක.ස

6.ප්‍රධාන අභ්‍යන්තර විගණක - ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය - දැ.ගැ. ස

MA/LETTER.COM

2012.05.

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය
නො.164,
ඇල්විටිගල මාවත
නාරාහේන්පිට.

**<u>පරිගණක විද්‍යාගාර පහසුකම් ලබා ගැනීම.</u>**

දිවයින පුරා ව්‍යාප්තව පවතින සමෘද්ධි බැංකු සංගම් කටයුතු වලට අදාලව සකස් කරන පරිගණක මෘදුකාංග සම්බන්ධ සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩල නිලධාරීන් දැනුවත් කිරීම වෙනුවෙන් දෙදින ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් පැවැත්වීමට ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය තීරණය කර ඇත.මෙම වැඩ සටහන ඔබ ආයතනයට අයත් දිස්ත්‍රික් පරිගණක විද්‍යාගාරගාර වලදී පැවැත්වීමට අදහස් කර ඇත.

ඒ අනුව අන්තර්ජාල පහසුකම් සහිත අවම වශයෙන් පරිගණක 15කින් සමන්විත පරිගණක විද්‍යාගාර මේ සඳහා යොදා ගත යුතු අතර මල්ටිමීඩියා පහසුකම්ද සහිත විය යුතුය.

එමෙන්ම දිස්ත්‍රික් මට්ටමින් 15ක කණ්ඩායම් ලෙස වැඩ සටහන් 200ක් පැවැත්වීමට සැලසුම් කර ඇති අතර සහනදායි මිලකට ඔබ ආයතනයේ දිස්ත්‍රික් පරිගණක විද්‍යාගාර මේ සඳහා යොදා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස කාරුණිකව ඉල්ලමි.

එස්.මඩවල ගමගේ
අධ්‍යක්ෂ (මානව සම්පත්)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

| අනු අංකය | දිස්ත්‍රික්කය | බැංකු සංගම් සංඛ්‍යාව | මහා සංගම් සංඛ්‍යාව | එකතුව | පුහුණු කණ්ඩායම | එක් වැඩසටහනකට සහභාගී කල හැකි | වැඩ සටහන් |
|---|---|---|---|---|---|---|---|

| | | | | | | සංඛ්‍යාව | ගණන |
|---|---|---|---|---|---|---|---|
| 1 | කුරුණෑගල | 120 | 30 | 150 | 450 | | |
| 2 | පුත්තලම | 48 | 16 | 64 | 192 | | |
| 3 | කොළඹ | 42 | 13 | 55 | 165 | | |
| 4 | කළුතර | 56 | 14 | 70 | 210 | | |
| 5 | ගම්පහ | 86 | 13 | 99 | 297 | | |
| 6 | යාපනය | 31 | 15 | 46 | 138 | | |
| 7 | වවුනියාව | 07 | 04 | 11 | 33 | | |
| 8 | අනුරාධපුරය | 54 | 23 | 77 | 231 | | |
| 9 | මඩකලපුව | 29 | 14 | 43 | 129 | | |
| 10 | අම්පාර | 43 | 20 | 63 | 189 | | |
| 11 | ත්‍රිකුණාමලය | 18 | 11 | 99 | 297 | | |
| 12 | පොලොන්නරුව | 22 | 07 | 29 | 87 | | |
| 13 | බදුල්ල | 44 | 15 | 59 | 177 | | |
| 14 | කෑගල්ල | 44 | 11 | 55 | 165 | | |
| 15 | මොණරාගල | 04 | 11 | 15 | 45 | | |
| 16 | ගාල්ල | 68 | 19 | 87 | 261 | | |
| 17 | මාතර | 50 | 16 | 66 | 198 | | |
| 18 | මහනුවර | 91 | 20 | 111 | 333 | | |
| 19 | මාතලේ | 40 | 11 | 51 | 153 | | |
| 20 | නුවරඑළිය | 35 | 05 | 40 | 120 | | |
| | එකතුව | | | | 3840 | | |

**<u>02. සමෘද්ධි බැංකු සංගම් ජාල ගත කිරීමට අදාලව සමෘද්ධි බැංකු කාර්ය මණ්ඩලය සඳහා පරිගණක උපාංග පරිශීලනය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම</u>.**

**<u>එක් පුහුණු වැඩසටහනක් සඳහා යන වියදම් ඇස්තමේන්තුව</u>**

| | |
|---|---|
| 01.පරිගණක විද්‍යාගාර භාවිතය සඳහා ගාස්තු දිනකට රු.10000/- X 2 | - රු.20000.00 |
| (ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පරිගණක විද්‍යාගාර) | |
| 02. සම්පත්දායක දීමනා | |
| (දේශන ගාස්තු දිනකට උපරිම රු.2000/-ක් වේ.) | - රු.4000.00 |
| 03. නිබන්ධන,සීඩී,ලිපිද්‍රව්‍ය හා වෙනත් (එක් නිලධාරියෙකු සඳහා රු.100/-කි ) | - රු.1500.00 |
| (සම්පත්දායක සඳහා සංග්‍රහ වියදමද මෙයට ඇතුලත්වේ) | |
| 04. වැඩසටහන් සම්බන්ධීකරණය 1 X 500 X දින 2 | - රු.1000.00 |
| එකතුව | **- රු.26500.00** |